**මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂ අවසාන වන විට හිඟ මුද්දර ගාස්තු රු. 5,950,450 ක් ලෙස ගණනය කර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල එම මුදල රු.2,996,691ක් ලෙස දක්වා තිබුණි. | අදාල වර්ෂය සඳහා මුදලින් ලැබෙන ආදායම් පමණක් නොව ලැබිය යුතු ආදායම්ද සැලකිල්ලට ගත යුතු වීම. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති හිඟ මුද්දර ගාස්තු රු.2,996,691 කි. මෙය ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලද දත්ත පදනම් කර ගනිමින් පිළියෙල කරනු ලැබූවකි. |
| (ආ) | පරිගණක අධ්‍යයන ගාස්තු රු. 146,729ක් ආදායමට මාරු කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදාල ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ආදායමට මාරුකිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. |

### 1.3.3 ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.213,432,560 ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාලව ඉඩම් ඔප්පු, වත්කම් ලේඛන හා අයිතිය තහවුරු කිරීමේ ලියවිලි ආදිය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සනාෝක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වාගෙන යාමට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අයිතිය තහවුරු කිරීමේ ලේඛන ගොනුගත කර ආරක්ෂා කිරීමට පියවර ගෙන ඇත. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නිතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | | |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සේවක මණ්ඩලය සඳහා වෙනමම මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි. | සභාවේ සේවය කරන සේවක මණ්ඩලය සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතුවේ. | පිළිගනිමි |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,953,013 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,357,433 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 650,350 | 650,650 | 548,445 | 177,310 | 660,350 | 784,780 | 709,375 | 75,405 |
| කුලී | 5,507,145 | 3,370,112 | 3,370,112 | - | 924,450 | 1,060,498 | 1,060,498 | - |
| බලපත්‍ර ගාස්තු | 1,375,000 | 1,949,930 | 1,949,930 | - | 1,145,450 | 691,655 | 691,655 | - |
| අනෙකුත් ආදායම් | 11,849,000 | 8,594,393 | 9,736,681 | 8,389,404 | 11,295,000 | 13,579,314 | 8,587,238 | 9,531,693 |
| **එකතුව** | **19,381,495** | **14,565,085** | **15,605,168** | **8,566,714** | **14,025,250** | **16,116,247** | **11,048,766** | **9,607,098** |

### 2.2.2 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) උසාවි දඩ මුදල්** | | |
| 2019 වර්ෂයේ උසාවි දඩ මුදල් මුළුමනින්ම ලබාගැනීම සඳහා විගණන දිනය වන 2020 මැයි 20 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නියමිත වර්ෂය සඳහා වූ දඩ ගාස්තු අදාල කාලපරිච්ඡේදය තුළ ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයට නියමිත උසාවි දඩ මුදල් ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| **(ආ) මුද්දර ගාස්තු** | | |
| 2019 ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා කාල පරාසයට අදාළ මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අදාල කාල පරාසය තුළ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | නියමිත කාල පරාසයට අදාල දඩ ගාස්තු ලබාගත යුතුවේ. | මුද්දර ගාස්තු අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, දැනට මුද්දර ගාස්තු සම්බන්ධ ලේඛන පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) අතුරු ව්‍යවස්ථා** | | |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ වියදීමත් කිරීම් සඳහා ප්‍රධාන කාරණා 05 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක | අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා සකස් කර අදාල අනුමැතිය ලබාගැනීමට යවා අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |

| | | |
|---|---|---|
| කළ යුතුව පැවතුණි. එසේ වුවත්, 2012 වර්ෂයේදී අතුරු ව්‍යවස්ථා පිළිබඳ අදහස් නැගෙනහිර පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යවා තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | | |

**(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

---------------------------------

| | | |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | දැනට සැකසීමට කටයුතු කර ඇති බව දැනුම් දෙමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------

| | | |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත්ව සිදු නොවූ අතර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සහ ප්‍රතිචක්‍රීයකරණ විකුණුම් වැනි කටයුතු හා ආදායම් ඉපැයීමේ කාර්යයන් කිසිවක්ද සිදු කර නොතිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණයෙන් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සහ ප්‍රතිචක්‍රීයකරණ විකුණුම් වැනි සැලැසුම් ක්‍රියාත්මක කර ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුවේ. | ජනාධිපතිතුමාගේ චක්‍රලේඛය ප්‍රකාරව, පර්චස් 20කට වැඩි ඉඩම් වපසරියක් සහිත පදිංචිකරුවන්ගෙන් දිරන අපද්‍රව්‍ය එකතුකිරීමට අවශ්‍ය නොවන බව සහ ඉදිරියේදී දිරන අපද්‍රව්‍ය රැස්කර ආදායම් ඉපැයීමේ කටයුතු ක්‍රියාත්මක කරනු ලබන බව දන්වා සිටිමි. |

**(ඈ) තිරසාර සංවර්ධන ඉලක්ක**

------------------------------

| | | |
|---|---|---|
| 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාල මාර්ගෝපදේශ පදනම් කරමින් සැලසුම් සකස් කර ඉදිරියේදි ක්‍රියාත්මක කිරීමට කටයුතු පිළියෙල කරනු ලැබේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පන්ඩාරියාවෙලි, කට්සේනෙයි සහ මාවඩි මුන්මාරි යන ප්‍රදේශවල පදිංචි පවුල්වලට ජලය ලබාගැනීම වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට රු. 6,992,833 ක මුදලක් ලබා දී තිබුණද 2020 මැයි 20 දින වන විටත් මෙම ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ කළ යුතු වේ. | අනාගතයේදී මෙවැනි අඩුපාඩු නොවන පරිදි කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ ගොඩනැඟිලි අයදුම්පත්‍රවලින් අයදුම්පත්‍ර 49 ක් කාලය ඉකුත්වීමෙන් අනුමැතිය ලබාදී එසේම තිබුණි. | නියමිත කාලපරිච්ඡේදය තුළ අනුමැතිය ලබාදී තිබිය යුතුවේ. | අයදුම්පත් අධීක්ෂණය කර තාක්ෂණික නිලධාරීගේ වාර්තා ලබාගැනීමට කාලය ගත වන බැවින් අයදුම්පත් සඳහාද කාලය ගතවී තිබුණි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තනතුරු 3 කට අදාළව පුරප්පාඩු 4 ක් හා තනතුරු 2 කට අදාළ සේවකයින් 8 දෙනෙකුගේ අතිරික්තයක් විය. | පුරප්පාඩු පුරවා ගැනීමට හා අතිරික්ත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරිමට ක්‍රියා මාර්ග ගත යුතුවේ. | අදාල පුරප්පාඩු පිරවීමට පියවර ගෙන ඇත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බදු ගිවිසුමේ කොන්දේසි අංක 5 ප්‍රකාරව, තෝරා ගනු ලබන ලංසුකරුවන් දේපළ ඇප හෝ රු. 25,000ක් මුදල් ඇප අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු බවට සඳහන් වුවත්, ගිවිසුම් 15ක් සම්බන්ධයෙන් කිසිදු ඇපයක් ලබාගෙන නොතිබුණි. මේ නිසා රු.797,295කට ලබාගත් පොදු වෙළෙඳ පොල බදු එකතුකිරීමේ බදු ගිවිසුම අතරමග නවතා තිබූ බව නිරීක්ෂණය විය. | දේපළ ඇප හෝ මුදල් ඇප අනිවාර්යයෙන් ලබාගත යුතුවේ. මුදල් ඇප බද්දට සරිලන පරිදි අයකළ යුතුවේ. | ඉදිරියේදි බදු ගිවිසුමේ කොන්දේසි අංක 5 අනෙකුත් ගිවිසුම්වල වටිනාකමට අනුකූල වනසේ බදු අයකිරීමට කටයුතු කෙරේ. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු සිදුකළ යුතු වේ. | අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කර කාර්යයන් හා වගකීම් පවරා ක්‍රියාත්මක කරනු ලැබේ. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතු වේ. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දැන් පවත්වනු ලැබේ. |